දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර.
ලංසු සඳහා ආරාධනය

<u>වතු ප්‍රදේශ වල ආපදා නිවාස වැඩසටහන - 2025 දෙනියායවත්ත,දෙනියාය.</u>
<u>මුළු පිරිවැය ඇස්තමේන්තු මුදල වැට් සහිත(නිවාස 15 ක් සඳහා) රු. 56,402,531.66 )</u>
<u>කොන්ත්‍රාත් අංකය - DSM/ENG/PRO/2025/15</u>

වතු ප්‍රදේශ වල ආපදා නිවාස වැඩසටහන - 2025 දෙනියායවත්ත ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාලව ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ ලංසු කැඳවනු ලැබේ.
ඉදිකිරීම් කාලය **දින 280** කි.

02. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛණ ගත නොවී සිටිය යුතු අතර, ලංසු භාරගැනීම සඳහා වන අවසාන දිනය දක්වා වලංගු වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) **$C_6$ සහ ඉහළ** ශ්‍රේණි සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

03. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරු වෙතින් ලබාගත හැකි අතර, ලංසු ලිපිලේඛණ එම ලිපිනයේදී රාජකාරි දිනයක 09.00 පැයේ සිට 16.00 පැය දක්වා පරික්ෂා කර බැලිය හැකිය.

සම්බන්ධ විය හැකි දුරකථන අංක : 041 – 2222233 , ෆැක්ස් : 041 - 2222234

04. මෙම ව්‍යාපෘතියට අදාල ලංසු ලේඛණ **2025/10/24** දින සිට **2025/11/10** වන දින ප.ව 2.00 දක්වා කාර්යාලයීය වැඩකරන දිනයන්හි දී කාර්යාලයේ ගිණුම් අංශය වෙත ආපසු නොගෙවන ගාස්තුව වන **රු.12500.00** ක මුදල ගෙවන ලද ලදුපත ඉංජිනේරු අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් කාර්යාල වේලාවන් තුලදී ලබා ගත හැකිය.

05. ලංසු **2025/11/11** වන දින ප.ව **2.00** පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 1 වන මහලේ දිස්ත්‍රික් ලේකම් නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ දිස්ත්‍රික් ලේකම්, මාතර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලංසු එවීමේදි කවරයේ වම්පස ඉහල **"වතු ප්‍රදේශ වල ආපදා නිවාස වැඩසටහන - 2025 දෙනියායවත්ත"** ලෙස සඳහන් කර මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවර වල දමා එම කවර දෙක එක් කවරයක බහා එවිය යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 1 වන මහලේ දිස්ත්‍රික් ලේකම් නිල සාකච්ඡා කාමරයේදි මෙම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්ත දක්වන ලංසුකරුවන් හා ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

06. පෙර ලංසු රැස්වීම **2025/11/03** දින පෙ.ව.**10.00** ට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 1 වන මහලේ දිස්ත්‍රික් ලේකම් නිල සාකච්ඡා කාමරයේදි පැවැත්වේ.

07. සියළුම ලංසු සමග පහත සඳහන් ආකාරයේ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය

- ලංසු ලේඛණවල 09 වන කොටසේ ඇතුලත්ව ඇති ආකෘතියට සාරානුකූල විය යුතුය
- මාතර දිස්ත්‍රික් ලේකම් නමින් නිකුත් කර තිබිය යුතුය
- **රු.650,000/-** ක් වටිනා ලංසු ඇපකරයක් විය යුතුය.
- ලංසු භාර ගැනීම සඳහා නියමිත අවසාන දින හෝ දීර්ඝ කරනු ලබන දින සිට **දින 119** ක් වලංගු විය යුතුය.
- ලංසු ලේඛණවල I T B 16 වන වගන්තියේ සඳහන් නියෝජිතායතනයක් වෙතින් ලබාගත් ලංසු ඇපකරයක් විය යුතුය
- ඉදිරිපත් කරනු ලබන ලංසු සුරක්ෂණය අවලංගු කල නොහැකි සහ ප්‍රසම්පාදන අස්ථිත්වය කරනු ලබන ප්‍රථම ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කල හැකි විය යුතුය.

ඕ.වී.චන්දන තිලකරත්න,
දිස්ත්‍රික් ලේකම් / දිසාපති,
මාතර.